# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

**අංක 2458/65 - 2025 ඔක්තෝබර් මස 18 වැනි සෙනසුරාදා - 2025.10.18**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

### රජයේ නිවේදන

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව**

නිවේදනය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44 වැනි ව්‍යවස්ථාවේ (1) අනු ව්‍යවස්ථාව යටතේ මා වෙත පැවරී ඇති බලතල ක්‍රියාත්මක කරමින්, ම විසින් 2024 නොවැම්බර් මස 25 දිනැති අංක 2412/08 දරන *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද නිවේදනය, 2025 ඔක්තෝබර් මස 17 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි පහත උපලේඛනයේ සඳහන් වන පරිදි සංශෝධනය කරනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

අනුර කුමාර දිසානායක,
ජනාධිපති.

2025 ඔක්තෝබර් මස 17 වැනි දින,
කොළඹ 01,
ජනාධිපති කාර්යාලයේ දී ය.

## උපලේඛනය

(1) එම නිවේදනයෙහි "අංක 01. ආරක්ෂක අමාත්‍ය" ශීර්ෂය සම්බන්ධයෙන් පහත සඳහන් පරිදි :-

(අ) එහි I වැනි තීරුවෙහි අංක 28 අයිතමය ඉවත් කර පහත සඳහන් අයිතමය ඇතුලත් කිරීමෙන් ;

28. සමුද්‍රීය ආරක්ෂාව සඳහා ජලමානක මැනුම් සිදුකිරීම, නාවික සටහන් සැකසීම හා නාවික ගමනාගමන තොරතුරු යාවත්කාලීන කිරීම හරහා නාවික ගමනාගමන ආරක්ෂාව සුරක්ෂිත කිරීම හා 1974 මුහුදේදී ජීවිත ආරක්ෂාව පිළිබඳ අන්තර්ජාතික සම්මුතිය ප්‍රකාරව ශ්‍රී ලංකාවේ අධිකරණ සීමාවට අයත් මුහුදේ ජලමානක විද්‍යා කටයුතු නියාමනය කිරීම.

(ආ) එහි II වැනි තීරුවෙහි අංක 25 අයිතමයට පසු පහත සඳහන් අයිතමයන් ඇතුලත් කිරීමෙන්;

26. ජාතික ජලශාස්ත්‍රීය සභාව
27. ශ්‍රී ලංකා ජාතික ජලශාස්ත්‍රීය කාර්යාලය

(ඇ) එහි II වැනි තීරුවෙහි පහත අයිතමය ඉවත් කිරීමෙන් ;

6. සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව

(ඈ) එහි III වැනි තීරුවෙහි (දෙමළ නිවේදනයේ පමණක්) පහත අයිතමය ඉවත් කිරීමෙන් ;

- ශ්‍රී ලංකා විදුලි සංදේශ පනත (1991 අංක 25) සහ සංශෝධන

(2) එම නිවේදනයෙහි "අංක 02. මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍ය" ශීර්ෂය සම්බන්ධයෙන් පහත සඳහන් පරිදි :-

(අ) එහි I වැනි තීරුවෙහි (සිංහල නිවේදනයේ පමණක්) අංක 38 අයිතමයට පසු පහත සඳහන් අයිතමය ඇතුලත් කිරීමෙන් ;

39. II තීරුවෙහි දැක්වෙන සියලුම ආයතනයන් අධීක්ෂණය කිරීම

(ආ) එහි I වැනි තීරුවෙහි දැක්වෙන අංක 37 අයිතමය වෙනුවට පහත අයිතමය ආදේශ කිරීමෙන් ;

37. II තීරුවෙහි 57 සිට 63 දක්වා ආයතන සමාලෝචනය කෙරේ

(ඇ) එහි I වැනි තීරුවෙහි පහත අයිතමය ඉවත් කිරීමෙන් ;

11. ද්විපාර්ශවික සහ බහු පාර්ශවික වෙළඳ ගිවිසුම් සහ එම ගිවිසුම් තුළින් පැන නගින ආරවුල් නිරාකරණය කිරීම ඇතුළු ජාත්‍යන්තර සහ කලාපීය වෙළඳ ඒකාබද්ධතාවයන් පහසුකරලීමේ සහ සම්බන්ධීකරණය කිරීමේ කේන්ද්‍රස්ථානය ලෙස ක්‍රියා කිරීම

(ඈ) එහි II වැනි තීරුවෙහි අංක 52 අයිතමය ඉවත් කර පහත සඳහන් අයිතමය ඇතුලත් කිරීමෙන්;

52. හොටෙල් ඩිවලපර්ස් (ලංකා) පෞද්ගලික සමාගම (PQ 143)

(ඉ) එහි II වැනි තීරුවෙහි දැක්වෙන අංක 55 අයිතමයට පසු පහත සඳහන් අයිතමය ඇතුලත් කිරීමෙන්

56. සූදු ක්‍රීඩා නියාමන අධිකාරිය

(ඊ) එහි II වැනි තීරුවෙහි අංක 56 සිට අංක 62 දක්වා වන අයිතමයන් පිළිවෙලින් අංක 57 සිට අංක 63 වශයෙන් නැවත අංක ගත කිරීමෙන්;

(උ) එහි III වැනි තීරුවෙහි “2002 අංක 24 දරන සුබසාධක ප්‍රතිලාභ පනත” අයිතමයට පසුව පහත අයිතමයන් එකතු කිරීමෙන් ;

- සමාජ ආරක්ෂණ දායකත්ව බදු පනත (2022 අංක 25)
- සුරක්ෂිතලත් ගනුදෙනු පනත (2024 අංක 17)
- සූදු ක්‍රීඩා නියාමන අධිකාරිය පනත (2025 අංක 17)

(3) එම නිවේදනයෙහි “ අංක 03. බලශක්ති අමාත්‍ය ” ශීර්ෂය සම්බන්ධයෙන් පහත පරිදි :-

(අ) එහි II වැනි තීරුවෙහි දැක්වෙන අංක 2 අයිතමය වෙනුවට පහත අයිතමය ආදේශ කිරීමෙන් ;

2. සීමාසහිත ලංකා විදුලි (පෞද්ගලික) සමාගම

(ආ) එහි II වැනි තීරුවෙහි අංක 12 අයිතමයට පසු පහත සඳහන් අයිතමයන් ඇතුලත් කිරීමෙන්;

13. නැෂනල් සිස්ටම් ඔපරේටර් ප්‍රයිවට් ලිමිටඩ්
14. නැෂනල් ට්‍රාන්ස්මිෂන් නෙට්වර්ක් සර්විස් ප්‍රවයිඩර් ප්‍රයිවට් ලිමිටඩ්
15. ඉලෙක්ට්‍රිසිටි ඩිස්ට්‍රිබියුෂන් ලංකා ප්‍රයිවට් ලිමිටඩ්
16. ඉලෙක්ට්‍රිසිටි ජෙනරේෂන් ලංකා ප්‍රයිවට් ලිමිටඩ්

(ඇ) එහි II වැනි තීරුවෙහි පහත අයිතමයන් ඉවත් කිරීමෙන් ;

10. ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලය
11. ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති නියාමන සභාව

(ඈ) එහි III වැනි තීරුවෙහි (සිංහල නිවේදනයේ පමණක්) “ඛනිජතෙල් නිෂ්පාදන (විශේෂ විධිවිධාන) පනත ( 2022 අංක 33)” ලෙස පවතින අයිතමය වෙනුවට පහත අයිතමය ආදේශ කිරීමෙන් ;

- ඛනිජතෙල් නිෂ්පාදන (විශේෂ විධිවිධාන) පනත ( 2002 අංක 33)

(ඉ) එහි III වැනි තීරුවෙහි පහත අයිතමය ඉවත් කිරීමෙන් ;

- ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති පනත (2014 අංක 40)

(4) එම නිවේදනයෙහි “ අංක 04. කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍ය ” ශීර්ෂය සම්බන්ධයෙන් පහත පරිදි:-

(අ) එහි II වැනි තීරුවෙහි අංක 11 අයිතමයට පසු පහත සඳහන් අයිතමය ඇතුලත් කිරීමෙන්;

12. කුරුඳු සංවර්ධන දෙපාර්තමේන්තුව

(ආ) එහි II වැනි තීරුවෙහි අංක 12 සිට අංක 29 දක්වා අයිතමයන් පිළිවෙලින් අංක 13 සිට අංක 30 වශයෙන් නැවත අංක ගත කිරීමෙන්;

(ඇ) එහි III වැනි තීරුවෙහි “ශ්‍රී ලංකා ජාතික සාගිනි නිවීමේ ව්‍යාපාර පනත (1973 අංක 18)” අයිතමය වෙනුවට පහත අයිතමය ආදේශ කිරීමෙන් ;

- ශ්‍රී ලංකා ජාතික සාගිනි නිවීමේ ව්‍යාපාර පනත (1973 අංක 15)

(ඈ) එහි III වැනි තීරුවෙහි (දෙමළ නිවේදනයේ පමණක්) පහත අයිතමය ඇතුලත් කිරීමෙන් ;

- අපනයන කෘෂිකර්මාන්තය ප්‍රවර්ධන පනත (1992 අංක 46)

(5) එම නිවේදනයෙහි "අංක 05. අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍ය" ශීර්ෂය සම්බන්ධයෙන් පහත පරිදි :-

(අ) එහි II වැනි තීරුවෙහි පහත අයිතමයන් ඉවත් කිරීමෙන් ;

12. ශ්‍රී ලංකා ඉන්ටර්නැෂනල් ආර්බිට්‍රේෂන් සෙන්ටර් (ගරන්ටි) ලිමිටඩ්
17. පුනරුත්ථාපන කොමසාරිස් ජනරාල් කාර්යාලය
26. පුනරුත්ථාපන කොමසාරිස් ජනරාල් කාර්යාංශය

(ආ) එහි III වැනි තීරුවෙහි "අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන්හට සහාය දීමේ සහ ආරක්ෂා කිරීමේ පනත (2015 අංක 4)" අයිතමය වෙනුවට පහත අයිතමය ආදේශ කිරීමෙන්

- අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් හට සහාය දීමේ සහ ආරක්ෂා කිරීමේ පනත (2023 අංක 10)

(ඇ) එහි III වැනි තීරුවෙහි "ජාතික සමගිය සහ ප්‍රතිසන්ධානය සඳහා වන කාර්යාලය පනත (2024 අංක 1)" අයිතමයට පසුව පහත අයිතමයන් එකතු කිරීමෙන් ;

- බලහත්කාරයෙන් අතුරුදහන් කිරීම්වලින් සියලු තැනැත්තන් ආරක්ෂා කිරීම සඳහා වූ ජාත්‍යන්තර සම්මුති පනත (2018 අංක 5)
- යම් තැනැත්තකුගේ මරණය සම්බන්ධයෙන් අලාභ අයකර ගැනීමේ පනත (2019 අංක 2)
- බද්දට දී ඇති පරිශ්‍රවල සන්තකය ආපසු ලබා ගැනීමේ පනත (2023 අංක 1)
- සමථකරණය තුළින් ඇතිවන්නා වූ අන්තර්ජාතික නිරවුල්කරණ ගිවිසුම් පිළිගැනීමේ සහ බලාත්මක කිරීමේ පනත (2024 අංක 5)
- අධිකරණයකට, විනිශ්චය අධිකාරයකට හෝ ආයතනයකට අපහාස කිරීම පනත (2024 අංක 8)
- අපරාධයකින් උත්පාදිත දේ පිළිබඳ පනත (2025 අංක 5)

(ඈ) එහි III වැනි තීරුවෙහි පහත අයිතමය ඉවත් කිරීමෙන් ;

- පුනරුත්ථාපන කාර්යාංශය පනත (2023 අංක 2)

(6) එම නිවේදනයෙහි "අංක 06. අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍ය" ශීර්ෂය සම්බන්ධයෙන් පහත පරිදි :-

(අ) එහි II වැනි තීරුවෙහි පහත අයිතමය ඉවත් කිරීමෙන් ;

6. ශ්‍රී ලංකා ග්‍රන්ථ සංවර්ධන මණ්ඩලය

(ආ) එහි II වැනි තීරුවෙහි දැක්වෙන අංක 15 අයිතමය වෙනුවට පහත අයිතමය ආදේශ කිරීමෙන් ;

15. ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය

(ඇ) එහි III වැනි තීරුවෙහි (දෙමළ නිවේදනයේ පමණක්) පහත අයිතමය ඉවත් කිරීමෙන් ;

- ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩල පනත (1988 අංක 51)

(7) එම නිවේදනයෙහි "අංක 08. වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමූපකාර සංවර්ධන අමාත්‍ය" ශීර්ෂය සම්බන්ධයෙන් පහත පරිදි :-

(අ) එහි I වැනි තීරුවෙහි අංක 3 අයිතමයට පසුව පහත සඳහන් අයිතමය ඇතුලත් කිරීමෙන්;

4. ද්විපාර්ශවික සහ බහු පාර්ශවික වෙළඳ ගිවිසුම් සහ එම ගිවිසුම් තුළින් පැන නගින ආරවුල් නිරාකරණය කිරීම ඇතුළු ජාත්‍යන්තර සහ කලාපීය වෙළඳ ඒකාබද්ධතාවයන් පහසුකරලීමේ සහ සම්බන්ධීකරණය කිරීමේ කේන්ද්‍රස්ථානය ලෙස ක්‍රියා කිරීම

(ආ) එහි I වැනි තීරුවෙහි අංක 7 අයිතමයට පසුව පහත සඳහන් අයිතමයන් ඇතුළත් කිරීමෙන් ;

8. බුද්ධිමය දේපළ පිළිබඳ ජාත්‍යන්තර සම්මුතිය පරිපාලනය කිරීමට අදාළ කාර්යයන්හි ප්‍රකාශන අයිතිය හා ජගත් බුද්ධිමය දේපළ කාර්යාලයෙහි ප්‍රකාශන අයිතිය සම්බන්ධ කටයුතු
9. පේටන්ට් බලපත්‍ර ලබා දීමේ ක්‍රමවේදය කාර්යක්ෂම කිරීම

(ඇ) එහි II වැනි තීරුවෙහි අංක 17 අයිතමයට පසු පහත සඳහන් අයිතමය ඇතුළත් කිරීමෙන් ;

18. සීමාසහිත ශ්‍රී ලංකා ත්‍රිපෝෂ සංස්ථාව

(ඈ) එහි II වැනි තීරුවෙහි දැක්වෙන අංක 13 අයිතමය වෙනුවට පහත අයිතමය ආදේශ කිරීමෙන් ;

13. ශ්‍රී ලංකා ස්ටේට් ට්‍රේඩිං (ජෙනරල්) කෝපරේෂන් ලිමිටඩ්

(ඉ) එහි II වැනි තීරුවෙහි පහත අයිතමය ඉවත් කිරීමෙන් ;

17. සීමාසහිත ලංකා ජෙනරල් ට්‍රේඩින් සමාගම

(ඊ) එහි III වැනි තීරුවෙහි “පොදු කොන්ත්‍රාත් පනත (1987 අංක 3)” අයිතමයට පසුව පහත අයිතමයන් එකතු කිරීමෙන් ;

- ආරක්ෂණ පියවර පනත (2018 අංක 3)
- සමිති ආඥාපනත (1891 අංක 16)

(8) එම නිවේදනයෙහි “අංක 09, සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍ය” ශීර්ෂය සම්බන්ධයෙන් පහත පරිදි:-

(අ) එහි II වැනි තීරුවෙහි අංක 41 අයිතමයට පසු පහත සඳහන් අයිතමය ඇතුළත් කිරීමෙන් ;

42. සීමාසහිත සැලසිනෝ මීඩියා සොලියුෂන්ස් (පුද්ගලික) ආයතනය

(ආ) එහි II වැනි තීරුවෙහි දැක්වෙන අංක 24 අයිතමය වෙනුවට පහත අයිතමය ආදේශ කිරීමෙන් ;

24. ආයුර්වේද අධ්‍යාපන හා ආරෝග්‍යශාලා මණ්ඩලය

(ඇ) එහි II වැනි තීරුවෙහි අංක 8 අයිතමය ඉවත් කර පහත සඳහන් අයිතමය ඇතුළත් කිරීමෙන් ;

8. ශ්‍රී ලංකා හෙද සභාව

(ඈ) එහි II වැනි තීරුවෙහි පහත අයිතමය ඉවත් කිරීමෙන් ;

29. මාර්ගගත ක්‍රමවල සුරක්ෂිතභාවය පිළිබඳ කොමිෂන් සභාව

(ඉ) එහි III වැනි තීරුවෙහි සිංහල නිවේදනයේ “හෝමියෝපති පනත (2070 අංක 07)” ලෙස ද, ඉංග්‍රීසි නිවේදනයේ “Homoeopathy Act No. 7 of 1970” ලෙස ද පවතින, අයිතමය වෙනුවට පහත අයිතමය ආදේශ කිරීමෙන් ;

- හෝමියෝපති පනත (2016 අංක 10)

(ඊ) එහි III වැනි තීරුවෙහි (දෙමළ නිවේදනයේ පමණක්) “තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත (2006 අංක 12)” ලෙස පවතින අයිතමය වෙනුවට පහත අයිතමය ආදේශ කිරීමෙන් ;

- තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත (2016 අංක 12)

(උ) එහි III වැනි තීරුවෙහි පහත අයිතමය ඉවත් කිරීමෙන් ;

- මාර්ගගත ක්‍රමවල සුරක්ෂිතභාවය පිළිබඳ පනත (2024 අංක 9)

(9) එම නිවේදනයෙහි “අංක 10. බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍ය” ශීර්ෂය සම්බන්ධයෙන් පහත පරිදි:-

(අ) එහි II වැනි තීරුවෙහි පහත අයිතමය ඉවත් කිරීමෙන් ;

25. සීමාසහිත සැලසිනේ මීඩියා සොලියුෂන්ස් (පුද්ගලික) ආයතනය

(ආ) එහි III වැනි තීරුවෙහි “ රාජ්‍ය චිත්‍රපට සංස්ථා පනත (1971 අංක 47) ” අයිතමයට පසුව පහත අයිතමය එකතු කිරීමෙන් ;

- ජාතික කෞතුකාගාර ආඥාපනත (1942 අංක 31)

(ඇ) එහි III වැනි තීරුවෙහි “ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩල පනත (1988 අංක 51)” ලෙස පවතින අයිතමය වෙනුවට පහත අයිතමය ආදේශ කිරීමෙන් ;

- ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩල පනත (1998 අංක 51)

(10) එම නිවේදනයෙහි “අංක 11. ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍ය” ශීර්ෂය සම්බන්ධයෙන් පහත සඳහන් පරිදි :-

(අ) එම ශීර්ෂය “අංක 11. ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍ය” වශයෙන් ;

(ආ) එහි I, II හා III වැනි තීරුවල දැක්වෙන අයිතමයන් ඉවත්කර ඒ වෙනුවට පහත සඳහන් අයිතමයන් ඇතුළත් කිරීමෙන්;

| *I වැනි තීරුව* | *II වැනි තීරුව* | *III වැනි තීරුව* |
|---|---|---|
| *විෂයයන් හා කාර්යයන්* | *දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා* | *ක්‍රියාත්මක කළයුතු නීති සහ අණ පනත්* |
| 1. රජය මගින් ක්‍රියාත්මක කරනු ලබන ජාතික ප්‍රතිපත්තීන් මත පිහිටා ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන විෂයයන්ට සහ II වැනි තීරුවෙහි දැක්වෙන දෙපාර්තමේන්තු හා ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථාවන්හි විෂයයන්ට අදාළ ප්‍රතිපත්ති, උපායමාර්ග, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම | 1. මාර්ග සංවර්ධන අධිකාරිය සහ හා එහි පාලිත සමාගම් හා ආශ්‍රිත සමාගම්<br>2. මග නැඟුම<br>3. රාජ්‍ය සංවර්ධන හා නිර්මාණ නීතිගත සංස්ථාව<br>4. ජාතික ගමනාගමන කොමිෂන් සභාව<br>5. මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව<br>6. ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව | • ජාතික මංමාවත් පනත (2008 අංක 40)<br>• මාර්ග සංවර්ධන අධිකාරිය පනත (1981 අංක 73)<br>• ජාතික ගමනාගමන කොමිෂන් සභා පනත (1991 අංක 37)<br>• දුම්රිය පනත (1950 අංක 18)<br>• ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩල පනත (2005 අංක 27)<br>• ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතන පනත (1997 අංක 25) |
| 2. අමාත්‍යාංශ විෂය පථයට අයත්වන මහජන සේවාවන් කාර්යක්ෂමව හා මහජන හිතකාමී අයුරින් ලබා දීම | 7. සීමාසහිත ලක්දිව ඉංජිනේරු (පෞද්) සමාගම<br>8. ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය | • මෝටර් රථ ප්‍රවාහන පනත (1951 අංක 14)<br>• නාගරික සංවර්ධන අධිකාරිය පනත (1978 අංක 41) |
| 3. නාස්තිය හා දූෂණය පිටු දකිමින් අමාත්‍යාංශයේ කාර්යභාරය ඉටු කිරීම සහතික කිරීමට ඉවහල් වන ආකාරයට නවීන කළමනාකරණ ක්‍රම හා තාක්ෂණය යොදා ගනිමින් සියලුම ක්‍රම සහ විධි ප්‍රතිසංස්කරණය කිරීම | 9. ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතනය<br>10. මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව<br>11. සහස්‍යා ඉන්වෙස්මන්ට් ලිමිටඩ්<br>12. නාගරික සංවර්ධන අධිකාරිය<br>13. නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය | • නාගරික සංවර්ධන ව්‍යාපෘති (විශේෂ විධිවිධාන) පනත (1980<br>• අංක 2)<br>• නාගරික ජනාවාස සංවර්ධන<br>• අධිකාරි පනත (2008 අංක 36)<br>• නගර හා ග්‍රාම නිර්මාණ ආඥාපනත (1946 අංක 13)<br>• බද්ධ නිවාස අයිතිවාසිකම් පනත (1973 අංක 11) |

| *I වැනි තීරුව* | *II වැනි තීරුව* | *III වැනි තීරුව* |
|---|---|---|
| *විෂයයන් හා කාර්යයන්* | *දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා* | *ක්‍රියාත්මක කළයුතු නීති සහ අණ පනත්* |
| 4. ග්‍රාමීය, පූර්ව නගර හා නාගරික ප්‍රදේශ සබඳතා පුළුල් කරමින් ජනතා කේන්ද්‍රීය ආර්ථික හා සමාජ සංවර්ධනයක් ඇතිවන ලෙස උසස් තත්ත්වයෙන් යුත් ජාතික මහාමාර්ග පද්ධතිය වැඩිදියුණු කිරීම සහ ප්‍රශස්ත තත්ත්වයෙන් පවත්වාගෙන යාම<br>5. අධිවේගී මාර්ග සංවර්ධනය, නඩත්තුව, ගාස්තු නියම කිරීම, රැස්කිරීම සහ නියාමනය කිරීම<br>6. පළාත් සභා සහ පළාත් පාලන ආයතනවලට අයත් මාර්ග පිළිබඳ ජාතික ප්‍රතිපත්ති පදනම් කොටගත් වැඩසටහන් හා ව්‍යාපෘති සකස් කිරීම, එම වැඩසටහන් සහ ව්‍යාපෘති සම්බන්ධීකරණය හා මෙහෙයවීම<br>7. වාහන තදබදය අවම කිරීම සඳහා වාහන අංගන පිහිටුවීම<br>8. ග්‍රාමීය මාර්ග ජාලය සංවර්ධනය හා නවීකරණය කිරීම<br>9. ප්‍රධාන මාර්ග සහ අධිවේගී මාර්ග සඳහා ඉහළ මට්ටමේ ප්‍රවේශයක් සඳහා විකල්ප මාර්ග පද්ධතියක් සකස් කිරීම<br>10. මාර්ග ජාලය හා බැඳුණු පාලම් පද්ධතිය නවීකරණය කිරීම<br>11. මඟී තොටුපල සේවාවන් සැපයීම<br>12. ආරක්ෂාකාරී සහ විශ්වාසනීය මඟී ප්‍රවාහන සේවාවක් සැපයීම<br>13. පරිසර හිතකාමී ප්‍රවාහන පද්ධතියක් හඳුන්වාදීම<br>14. පෞද්ගලික ප්‍රවාහන සේවාවන් නියාමනය කිරීම<br>15. බස් රථ නිෂ්පාදන හා ප්‍රවාහන ක්ෂේත්‍ර යටිතල පහසුකම්වලට අදාළ දේශීය කර්මාන්ත පද්ධතියක් ගොඩනැගීම<br>16. නව දුම්රිය මාර්ග ඉදිකිරීම, පවතින දුම්රිය මාර්ග නඩත්තු කිරීම, පුළුල් කිරීම සහ ඊට අදාළව ඉඩම් පවරා ගැනීම සහ යටිතල පහසුකම් සංවර්ධනය ඇතුලු සියලු කටයුතු<br>17. වරායන් වෙත දුම්රිය මඟින් භාණ්ඩ ප්‍රවාහනය කිරීමට අවශ්‍ය පහසුකම් ස්ථාපිත කිරීම හා පුළුල් කිරීම<br>18. 24/7 පුරා පවතින දුම්රිය සේවාවක් සැපයීම | 14. සහාධිපත්‍ය කළමනාකරණ අධිකාරිය (පොදු පහසුකම් මණ්ඩලය)<br>15. සෙලෙන්දිව ඉන්වෙස්ට්මන්ට් ලිමිටඩ්<br>16. ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව<br>17. ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව හා එහි පාලිත සමාගම් සහ අනුබද්ධ සමාගම් | • බද්ධ නිවාස අයිතිවාසිකම් (විශේෂ විධිවිධාන) පනත (2018 අංක 23)<br>• බද්ධ නිවාස අයිතිවාසිකම් (විශේෂ විධිවිධාන) පනත (1999 අංක 4)<br>• පොදු පහසුකම් මණ්ඩල පනත (1973 අංක 10)<br>ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ<br>• සංස්ථා පනත (1968 අංක 15)<br>• වෙනත් අමාත්‍යවරයෙක් යටතට නිශ්චිතව පවරා නොමැති, මෙහි I හා II තීරුවල සඳහන් විෂයයන්ට අදාළ අනෙකුත් සියලු ව්‍යවස්ථාවන් |

| *I වැනි තීරුව* | *II වැනි තීරුව* | *III වැනි තීරුව* |
|---|---|---|
| *විෂයයන් හා කාර්යයන්* | *දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා* | *ක්‍රියාත්මක කළයුතු නීති සහ අණ පනත්* |
| 19. විදුලි දුම්රියන් ලබා ගැනීමට හැකිවන පරිදි දුම්රිය පද්ධතිය ක්‍රම ක්‍රමයෙන් සංවර්ධනය කිරීම | | |
| 20. තනි පීල්ලේ දුම්රිය සේවාවක් හා සැහැල්ලු දුම්රිය මාර්ග ක්‍රමයෙන් හඳුන්වා දීම | | |
| 21. රජයේ හා පෞද්ගලික බස් රථ සේවාවන් ඒකාබද්ධ කර, නව තාක්ෂණය උපයෝගී කරගනිමින් පොකුරු බස් රථ සමාගම් නිර්මාණය කිරීම | | |
| 22. POS ප්‍රවේශපත්‍ර නිකුත් කිරීමේ යන්ත්‍ර සියලු බස් රථ සඳහා හඳුන්වා දීම | | |
| 23. ප්‍රධාන නගර තුළ ආරක්ෂිත පාපැදි මංතීරු නිර්මාණය කිරීම | | |
| 24. ප්‍රධාන දුම්රිය හා බස් නැවතුම්පල හා අනෙකුත් පොදු ස්ථාන ආසන්නයෙහි පාපැදි අංගන පහසුකම් සැපයීම | | |
| 25. ප්‍රධාන නගරවල මාර්ග දෙපස පදික මාරු නිර්මාණය කිරීම | | |
| 26. වාරි ප්‍රවාහනය ප්‍රවර්ධනය කිරීම සම්බන්ධයෙන් පර්යේෂණ සිදුකර උපදෙස් ලබා දීම සඳහා තාක්ෂණික ඒකකයක් ස්ථාපිත කිරීම | | |
| 27. වාරිමාර්ග හරහා මගී හා භාණ්ඩ ප්‍රවාහන සේවාවන් ක්‍රියාත්මක කිරීම | | |
| 28. ආබාධිත, වයෝවෘද්ධ අයවලුන් සඳහා දුම්රිය හා බස් රථ, දුම්රිය ස්ථාන හා බස් නැවතුම්පලවල විශේෂ ප්‍රවේශ්‍යතා පහසුකම් සලසා දීම | | |
| 29. මෝටර් රථ වාහන ලියාපදිංචි කිරීම සහ බලපත්‍ර නිකුත් කිරීම | | |
| 30. රියදුරු බලපත්‍ර නිකුත් කිරීම | | |
| 31. මෝටර් රථවාහනවලට අදාළ මාර්ගෝපදේශ සහ නීතිරීති නිකුත් කිරීම සහ නියාමනය කිරීම | | |
| 32. හරිතාගාර වායු විමෝචනය අවම කිරීම සඳහා ප්‍රවාහන ක්ෂේත්‍රයේ දායකත්වය උදෙසා උපායමාර්ගික වැඩසටහන් ක්‍රියාත්මක කිරීම | | |
| 33. මහනගර, උපනගර හා තදාසන්න නගර සැලසුම්කරණය හා සංවර්ධනය | | |

| *I වැනි තීරුව* | *II වැනි තීරුව* | *III වැනි තීරුව* |
|---|---|---|
| *විෂයයන් හා කාර්යයන්* | *දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා* | *ක්‍රියාත්මක කළයුතු නීති සහ අණ පනත්* |
| 34. නාගරික ප්‍රදේශවල ආර්ථික, සාමාජීය සහ භෞතික සංවර්ධනය ඒකාබද්ධව විධිමත් ලෙස ප්‍රවර්ධනය කිරීම හා නියාමන කටයුතු | | |
| 35. නාගරික ප්‍රදේශයන් තුළ දැරිය හැකි මිලකට නිවාස ව්‍යාපෘති සංවර්ධනය කිරීම සඳහා පුද්ගලික අංශය උනන්දු කරවීම හා මෙම ප්‍රයත්නය සඳහා සුදුසු ඉඩම් ලබා දීම | | |
| 36. නාගරික ඝන අපද්‍රව්‍ය කළමනාකරණය | | |
| 37. වගකීම් රහිත කසල බැහැර කිරීම් වැලැක්වීමට පියවර ගැනීම | | |
| 38. සියළුම නාගරික ඉදිකිරීම් නියාමනය කිරීමට අවශ්‍ය වැඩ පිළිවෙළක් සකස් කිරීම | | |
| 39. සියලු නාගරික ඉදිකිරීම්වල දී රථ වාහන නැවැත්වීමේ අංගන හා ආබාධිත අය සඳහා ප්‍රවේශ පහසුකම් ඇතිකිරීම සහතික කිරීම | | |
| 40. ජාතික භෞතික සැළසුම් හා ප්‍රාදේශීය භෞතික සැළසුම් පිළියෙල කිරීම | | |
| 41. ඒකාබද්ධ නාගරික සංවර්ධනයක් සහතික කිරීම සඳහා ජාතික භෞතික සැලසුම් පදනම් කර ගෙන සියලු ඉදිකිරීම් කටයුතු මෙහෙයවීම හා නියාමනය සිදුකිරීම | | |
| 42. සහාධිපත්‍ය දේපල කළමනාකරණය සහ නියාමන කටයුතු | | |
| 43. මහජන සහාධිපත්‍ය ප්‍රතිසංස්කරණය කිරීම සහ කාර්යක්ෂම සහ කඩිනම් ලෙස නිවාසවල අයිතිය පැවරීම | | |
| 44. පහත් බිම් ගොඩකිරීම සහ සංවර්ධනයට අදාළ කටයුතු | | |
| 45. නාගරික ප්‍රදේශවල පිහිටි සේවා හා පහසුකම් අඩු ප්‍රදේශ සහ වගුරු බිම් පොදු සැලැස්මකට අනුව සංවර්ධනය කිරීමට අවශ්‍ය මඟපෙන්වීම | | |
| 46. II තීරුවෙහි දැක්වෙන ආයතනයන්ට පැවරී ඇති අනෙකුත් සියලුම විෂයයන්ට අදාළ කටයුතු | | |
| 47. II තීරුවෙහි දැක්වෙන සියලුම ආයතනයන් අධීක්ෂණය කිරීම | | |

(11) එම නිවේදනයෙහි “අංක 12. මහජන ආරක්ෂක හා පාර්ලිමේන්තු කටයුතු අමාත්‍ය” ශීර්ෂය සම්බන්ධයෙන් පහත පරිදි:-

(අ) එහි I වැනි තීරුවෙහි අංක 9 අයිතමය ඉවත් කර පහත අයිතමය ඇතුලත් කිරීමෙන් ;

9. මත්ද්‍රව්‍යවලට ඇබ්බැහිවූවන් පුනරුත්ථාපනය කිරීම හා වෙනත් යම් නීතියක් මඟින් පුනරුත්ථාපනය කළ යුතු යැයි අර්ථකථනය කරන අය පුනරුත්ථාපනයට යොමු කිරීම

(ආ) එහි II වැනි තීරුවෙහි අංක 5 අයිතමයට පසු පහත සඳහන් අයිතමයන් ඇතුලත් කිරීමෙන්;

6. සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව
7. පුනරුත්ථාපන කාර්යාංශය

(ඇ) එහි II වැනි තීරුවෙහි පහත අයිතමය ඉවත් කිරීමෙන් ;

5. රාජ්‍ය නොවන සංවිධාන සඳහා වන ජාතික ලේකම් කාර්යාලය

(ඈ) එහි III වැනි තීරුවෙහි “මාර්ගගත ක්‍රමවල සුරක්ෂිත භාවය පිළිබඳ පනත (2024 අංක 9)” අයිතමයට පසුව පහත අයිතමයන් එකතු කිරීමෙන් ;

- පුනරුත්ථාපන කාර්යාංශය පනත (2023 අංක 2)
- පරිගණක අපරාධ පනත (2007 අංක 24)
- විදේශ ගමන් බලපත්‍ර (විධිමත් කිරීමේ) සහ පිටවීමේ අවසර පත්‍ර පනත (1971 අංක 53)

(ඉ) එහි III වැනි තීරුවෙහි පහත අයිතමය ඉවත් කිරීමෙන් ;

- මාර්ගගත ක්‍රමවල සුරක්ෂිත භාවය පිළිබඳ පනත (2024 අංක 9)

(12) එම නිවේදනයෙහි “අංක 14. පරිසර අමාත්‍ය” ශීර්ෂය සම්බන්ධයෙන් පහත පරිදි:-

(අ) එහි II වැනි තීරුවෙහි පහත අයිතමයන් ඉවත් කිරීමෙන් ;

2. භූවිද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය
3. සීමාසහිත GSMB තාක්ෂණික සේවා පුද්ගලික සමාගම

(ආ) එහි II වැනි තීරුවෙහි අංක 4 සිට අංක 12 දක්වා අයිතමයන් පිළිවෙලින් අංක 2 සිට අංක 10 වශයෙන් නැවත අංක ගත කිරීමෙන්;

(ඇ) එහි III වැනි තීරුවෙහි (දෙමළ නිවේදනයේ පමණක්) “වෙරළ සංරක්ෂණ පනත (1981 අංක 57)” අයිතමයට පසුව පහත අයිතමය එකතු කිරීමෙන් ;

- වනසංරක්ෂණ ආඥාපනත (1907 අංක 16)

(ඈ) එහි III වැනි තීරුවෙහි පහත අයිතමය ඉවත් කිරීමෙන් ;

- පතල් හා ඛනිජ පනත (1992 අංක 33)

(13) එම නිවේදනයෙහි “අංක 15. නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස අමාත්‍ය” ශීර්ෂය සම්බන්ධයෙන් පහත පරිදි:-

(අ) එම ශීර්ෂය “අංක 15. වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍ය” වශයෙන් ;

(ආ) එහි I, II හා III වැනි තීරුවල දැක්වෙන අයිතමයන් ඉවත්කර ඒ වෙනුවට පහත සඳහන් අයිතමයන් ඇතුළත් කිරීමෙන්;

| *I වැනි තීරුව* | *II වැනි තීරුව* | *III වැනි තීරුව* |
|---|---|---|
| *විෂයයන් හා කාර්යයන්* | *දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා* | *ක්‍රියාත්මක කළයුතු නීති සහ අණ පනත්* |
| 1. රජය මගින් ක්‍රියාත්මක කරනු ලබන ජාතික ප්‍රතිපත්තීන් මත පිහිටා වරාය සහ සිවිල් ගුවන් සේවා විෂයයන්ට සහ II වැනි තීරුවෙහි දැක්වෙන දෙපාර්තමේන්තු හා ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථාවන්හි විෂයයන්ට අදාළ ප්‍රතිපත්ති, උපායමාර්ග, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම<br>2. අමාත්‍යාංශ විෂය පථයට අයත්වන මහජන සේවාවන් කාර්යක්ෂමව හා මහජන හිතකාමී අයුරින් ලබා දීම<br>3. නාස්තිය හා දූෂණය පිටු දකිමින් අමාත්‍යාංශයේ කාර්යභාරය ඉටු කිරීම සහතික කිරීමට ඉවහල් වන ආකාරයට නවීන කළමනාකරණ ක්‍රම හා තාක්ෂණය යොදා ගනිමින් සියලුම ක්‍රම සහ විධි ප්‍රතිසංස්කරණය කිරීම<br>4. වාණිජ වරායන් සංවර්ධනය, කළමනාකරණය හා ඒවායේ ආයෝජන අවස්ථා පුළුල් කිරීම<br>5. බහාලුම් අංගන සංවර්ධනය කිරීම<br>6. අද්මිරාල්තියට අයත් ඒවා හැර අනෙකුත් වරාය තෙල් ටැංකි උපකරණ, ප්‍රදීපාගාර සහ ප්‍රදීපස්ථම්භ සංවර්ධන සහ පරිපාලන කටයුතු<br>7. නාවික සේවා සැපයුම්කරුවන් හා පරිහරණය කරන්නන් අතර ආරවුල් බේරුම්කරණය<br>8. නාවික සේවාවන් සඳහා තරහ රීති මාලාවන් පැනවීම<br>9. නාවික සැපයුම්කරුවන් සහ පරිහරණය කරන්නන් අතර උපදේශාත්මක සම්බන්ධීකරණය තහවුරු කිරීම හා ඒ සඳහා පහසුකම් සැලසීම<br>10. බුන් යාත්‍රා සහ සමුද්‍රමුක්තාවශේෂ භාරගැනීම<br>11. ප්‍රවාහන හා නාවික සේවාවන් සහ වෙරළාසන්න මගී තදබදය සඳහා පහසුකම් සැලසීම | 1. ශ්‍රී ලංකා වරාය අධිකාරිය සහ හා එහි පාලිත සමාගම් හා ආශ්‍රිත සමාගම්<br>2. සීමාසහිත ලංකා නැව් සංස්ථාව<br>3. වෙළඳ නාවික ලේකම් කාර්යාලය<br>4. ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරිය<br>5. සීමාසහිත ගුවන් තොටුපළ හා ගුවන්සේවා (ශ්‍රී ලංකා) සමාගම<br>6. ශ්‍රී ලංකන් එයාර් ලයින්ස් සහ පරිපාලිත සමාගම් | • ලංකා නැව් සංස්ථා පනත (1971 අංක 11)<br>• නැව් නියෝජිතයින්ට බලපත්‍රදීමේ පනත (1972 අංක 10)<br>• මාස්ටර්ස් ඇටෙන්ඩන්ට් ආඥාපනත (1865 අංක 6)<br>• වෙළඳ නැව් පනත (1971 අංක 52)<br>• ශ්‍රී ලංකා වරාය අධිකාරිය පනත (1979 අංක 51)<br>• පහයන තටාක හා පේටන්ට් දියත් ආඥාපනත (1908 අංක 5)<br>• බෝට්ටු ආඥාපනත (1900 අංක 4)<br>• ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරී පනත (2002 අංක 34)<br>• සිවිල් ගුවන් සේවා පනත (2010 අංක 14)<br>• ගුවන් සංතරණ (විශේෂ විධිවිධාන) පනත (1982 අංක 02)<br>• ගුවන් ප්‍රවාහන පනත (2018 අංක 29)<br>• ගගන යාත්‍රාංගන පනත (1950 අංක 15)<br>• වෙනත් අමාත්‍යවරයෙක් යටතට නිශ්චිතව පවරා නොමැති, මෙහි I හා II තීරුවල සඳහන් විෂයයන්ට අදාළ අනෙකුත් සියලු ව්‍යවස්ථාවන් |

| *I වැනි තීරුව* | *II වැනි තීරුව* | *III වැනි තීරුව* |
|---|---|---|
| *විෂයයන් හා කාර්යයන්* | *දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා* | *ක්‍රියාත්මක කළයුතු නීති සහ අණ පනත්* |
| 12. නෞකා හිමිකාරීත්වය සහ මෙහෙයුම්, නැව් කළමනාකරණය, නැව් තැරැව්කරණය සහ නියෝජිත සේවා<br>13. රේගු නියෝජිතායතන සහ සමස්ථ නෞකා භාණ්ඩ ප්‍රවාහන විසඳුම්<br>14. ජාත්‍යන්තර හා දේශීය ගුවන් තොටුපලවල් සංවර්ධනය සහ නියාමන කටයුතු සිදුකිරීම<br>15. ගුවන්තොටුපල මගින් සැලසෙන සේවාවන්වල ගාස්තු සහ ගුණාත්මකභාවය නියාමනය කිරීම<br>16. ජාත්‍යන්තර ගුවන් සේවාවන් පුළුල් කිරීම සඳහා අනෙකුත් රටවල් සමග ගිවිසුම්වලට එළැඹීම ඇතුළුව අනෙකුත් අවශ්‍ය පියවර ගැනීම<br>17. ශ්‍රී ලංකාවේ ගුවන් තොටුපලවල් විදේශ රටවල් විසින් භාවිතා කිරීමට අදාළ කටයුතු ප්‍රවර්ධනය හා නියාමනය<br>18. ගුවන් මඟින් සිදුකරන භාණ්ඩ ප්‍රවාහන පහසුකම් පුළුල් කිරීම<br>19. දේශීය ගුවන් ගමන් ප්‍රවර්ධනය කිරීම<br>20. පුද්ගලික ගුවන් ගමන් සේවා නියාමනය<br>21. ගුවන්යානා ලියාපදිංචි කිරීම<br>22. II තීරුවෙහි දැක්වෙන ආයතනයන්ට පැවරී ඇති අනෙකුත් සියලුම විෂයයන්ට අදාළ කටයුතු<br>23. II තීරුවෙහි දැක්වෙන සියලුම ආයතනයන් අධීක්ෂණය කිරීම | | |

(14) එම නිවේදනයෙහි “අංක 17. රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍ය” ශීර්ෂය සම්බන්ධයෙන් පහත පරිදි:-

(අ) එහි I වැනි තීරුවෙහි පහත අයිතමය ඉවත් කිරීමෙන් ;

26. ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලව කම්කරු සබඳතා ප්‍රමිතීන්, සේවක පරිපාලනය, සුභසාධනය සහ සෞඛ්‍ය සම්බන්ධයෙන් ප්‍රතිපත්ති සකස් කිරීම සහ ක්‍රියාත්මක කිරීම

(ආ) එහි III වැනි තීරුවෙහි පහත අයිතමය ඉවත් කිරීමෙන් ;

- ළමයින් දරුකමට හදාගැනීමේ ආඥා පනත (1941 අංක 24)

(15) එම නිවේදනයෙහි "අංක 18, කම්කරු අමාත්‍ය" ශීර්ෂය සම්බන්ධයෙන් පහත පරිදි:-

(අ) එහි III වැනි තීරුවෙහි " ශ්‍රම වාසනා අරමුදල් පනත (1998 අංක 12)" අයිතමයට පසුව පහත අයිතමයන් එකතු කිරීමෙන් :-

- සේවකයින්ගේ අයවැය සහන දීමනා පනත (2005 අංක 36)
- සේවකයින්ගේ අයවැය සහන දීමනා පනත (2016 අංක 04)
- ජාතික අවම වේතනය පනත (2016 අංක 03)
- සේවා නියුක්තිකයන් විශ්‍රාම යෑමේ අවම වයස පනත (2021 අංක 28)
- කාර්මික ආරවුල් (විශේෂ විධිවිධාන) පනත (2022 අංක 19)
- ඉන්දියානු සංක්‍රමණික කම්කරු ආඥාපනත (1923 අංක 01)
- වතු කම්කරු (ඉන්දියානු) ආඥාපනත (1889 අංක 13)
- පෞද්ගලික අංශයේ පුහුණු වන්නන් සේවයේ යෙදවීමේ පනත (1978 අංක 08)
- ජාතික ශ්‍රම අධ්‍යයන ආයතන පනත (2010 අංක 12)

(16) එම නිවේදනයෙහි "අංක 19, විද්‍යා සහ තාක්ෂණ අමාත්‍ය " ශීර්ෂය සම්බන්ධයෙන් පහත පරිදි:-

(අ) එහි I වැනි තීරුවෙහි පහත අයිතමයන් ඉවත් කිරීමෙන් :-

8. නවීන තාක්ෂණය යොදා ගනිමින් සැමට තොරතුරු තාක්ෂණ පහසුකම් සැපයීම සඳහා අවශ්‍ය පියවර ගැනීම.
9. අන්තර් රාජ්‍ය ආයතන සඳහා තොරතුරු තාක්ෂණය හඳුන්වා දීම තුළින් රජයේ සේවා සැපයීමේ ඵලදායීතාව හා කාර්යක්ෂමතාව ඉහළ නැංවීම සඳහා තොරතුරු තාක්ෂණ මූලාරම්භය සඳහා පහසුකම් සැපයීම හා අධීක්ෂණය.
10. තොරතුරු තාක්ෂණ සාක්ෂරතාවය ප්‍රවර්ධනය සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
11. සමාජයේ සියලුම ස්ථරවල තොරතුරු තාක්ෂණය භාවිතය ධෛර්යමත් කිරීම හා ඉහළ නැංවීම සඳහා උපාය මාර්ග සංවර්ධනය සහ පුද්ගලික අංශය සමඟ හවුල්වී තොරතුරු තාක්ෂණ මූලාරම්භයන් සම්බන්ධීකරණය හා පහසුකම් සැලසීම.
12. සයිබර් ආරක්ෂණයට අදාළ සිද්ධීන් සම්බන්ධයෙන් සක්‍රීයව මැදිහත්වීම හා එවැනි සිද්ධීන් වැළැක්වීම.
13. ඩිජිටල් ව්‍යෝහාරික පරීක්ෂණ සඳහා අවශ්‍ය කරනු ලබන තාක්ෂණික සහය ලබාදීම.
15. ඩිජිටල් තාක්ෂණ ව්‍යාපාර පුළුල් කිරීම සම්බන්ධ කටයුතු.
18. ග්‍රාමීය ප්‍රදේශ සඳහා සන්නිවේදන පහසුකම් පුළුල් කිරීම සඳහා මධ්‍යගත උපකාරක ජාලයක් ඇති කිරීම.
19. 5G සහ LTE+ වැනි සංඛ්‍යාත පරාසය තුළ ඉහළ කාර්යක්ෂමතාවයක් සහිත තාක්ෂණය සඳහා ප්‍රමුඛත්වය ලබා දීම.

(ආ) එහි II වැනි තීරුවෙහි අංක 16 අයිතමයට පසු පහත සඳහන් අයිතමයන් ඇතුලත් කිරීමෙන් :

17. ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලය ;
18. ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති නියාමන සභාව.

(ඇ) එහි III වැනි තීරුවෙහි "ඉලෙක්ට්‍රොනික් ගනුදෙනු පනත (2006 අංක 19)" අයිතමය ඉවත් කර පහත අයිතමය එකතු කිරීමෙන් :-

- ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති පනත (2014 අංක 40)

(17) එම නිවේදනයෙහි "අංක 20, ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබල ගැන්වීම් අමාත්‍ය" ශීර්ෂය සම්බන්ධයෙන් පහත පරිදි:-

(අ) එහි I වැනි තීරුවෙහි අංක 06,10,11,12 හා 13 අයිතමයන් වෙනුවට පහත සඳහන් අයිතමයන් ආදේශ කිරීමෙන් ;

06. ආබාධ සහිත පුද්ගලයන්ගේ අවශ්‍යතාවයන් හඳුනාගැනීම හා එම අවශ්‍යතා ඉටුකර දීම.

10. ආබාධ සහිත පුද්ගලයන් සම්බන්ධයෙන් අන්තර්ජාතික වශයෙන් පිළිගනු ලබන සම්මුතීන් වලට අදාළ කටයුතු.

11. ආබාධ සහිත පුද්ගලයන් සඳහා වෘත්තීය පුහුණුව ලබාදීමට හා රැකියා අවස්ථා ඇති කරලීමට අදාළ ආයතන සමග සම්බන්ධීකරණය කරමින් අවශ්‍ය වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

12. ආබාධ සහිත පුද්ගලයින් ජනප්‍රවාහය හා එක්ව කටයුතු කිරීමට හැකි වන සේ අවශ්‍ය ප්‍රතිපත්තිමය වෙනස්කම් සිදු කිරීම හා අවශ්‍ය පහසුකම් හා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
13. ආබාධ සහිත පුද්ගලයන් සඳහා සමාජ රක්ෂණ ක්‍රම ක්‍රියාත්මක කිරීම.

(ආ) එහි I වැනි තීරුවෙහි අංක 14 අයිතමයට පසුව පහත සඳහන් අයිතමයන් ඇතුලත් කිරීමෙන් :

15. දිළිඳු බව තුරන් කිරීම සඳහා බහුවිධ ප්‍රවේශයන් ඇතුලත් ප්‍රජා සවිබලගැන්වීම් කටයුතු සිදු කිරීම.
16. ග්‍රාමීය සංවර්ධනය සඳහා වූ ඒකාබද්ධ ප්‍රවේශයන් ගොඩනැංවීම හා ක්‍රියාත්මක කිරීම.
17. සමාජ වැඩ පිළිබඳ අධ්‍යාපනය හා වෘත්තීමය නිපුනයන් සමාජගත කිරීම.
18. ප්‍රජා සවිබලගැන්වීම්, සමාජ ආරක්ෂණය සහ ග්‍රාමීය සංවර්ධනය ප්‍රවර්ධනය.
19. ජාතික ප්‍රතිපත්ති රාමුව තුළ රාජ්‍ය නොවන සංවිධාන වල කාර්යයන් සම්බන්ධීකරණය කරමින් රටේ සංවර්ධන ක්‍රියාවලිය සඳහා දායක වීමට අවස්ථා සැලසීම.
20. ලෝක ආහාර වැඩසටහන සමඟ සහයෝගීතාවය කළමනාකරණය කිරීම සහ පහසුකම් සැලසීම.

(ඇ) එහි I වැනි තීරුවෙහි අංක 15 සහ අංක 16 අයිතමයන් පිළිවෙලින් අංක 21 සහ අංක 22 වශයෙන් නැවත අංක ගත කිරීමෙන් ;

(ඈ) එහි II වැනි තීරුවෙහි අංක 10 අයිතමයට පසු පහත සඳහන් අයිතමයන් ඇතුලත් කිරීමෙන්;

11. රාජ්‍ය නොවන සංවිධාන සඳහා වන ජාතික ලේකම් කාර්යාලය.
12. ලෝක ආහාර වැඩසටහන් සහයෝගීතාවය සඳහා වන හවුල්කාරිත්ව ලේකම් කාර්යාලය.

(18) එම නිවේදනයෙහි "අංක 21. කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍ය" ශීර්ෂය සම්බන්ධයෙන් පහත සඳහන් පරිදි:-

(අ) එහි I වැනි තීරුවෙහි (සිංහල නිවේදනයේ පමණක්) අංක 33 අයිතමයට පසුව පහත සඳහන් අයිතමයන් ඇතුලත් කිරීමෙන්;

34. භාණ්ඩ හා සේවා අපනයනය සඳහා අවශ්‍ය යටිතල පහසුකම් සැපයීම.
35. අවශ්‍ය ණය, රක්ෂණ සහ අනෙකුත් පහසුකම් සැපයීම හරහා නිෂ්පාදකයින් හා අපනයනකරුවන් දිරිමත් කිරීම.

(ආ) එහි I වැනි තීරුවෙහි (සිංහල නිවේදනයේ පමණක්) පහත අයිතමයන් ඉවත් කිරීමෙන් ;

7. බුද්ධිමය දේපළ පිළිබඳ ජාත්‍යන්තර සම්මුතිය පරිපාලනය කිරීමට අදාළ කාර්යයන්හි ප්‍රකාශන අයිතිය හා ජගත් බුද්ධිමය දේපල කාර්යාලයෙහි ප්‍රකාශන අයිතිය සම්බන්ධ කටයුතු.
8. පේටන්ට් බලපත්‍ර ලබා දීමේ ක්‍රමවේදය කාර්යක්ෂම කිරීම.

(ඇ) එහි I වැනි තීරුවෙහි (ඉංග්‍රීසි හා දෙමළ නිවේදනයේ පමණක්) අංක 7, අංක 8, අංක 35 හා අංක 36 අයිතමයන් ඉවත් කිරීමෙන් ;

(ඈ) එහි I වැනි තීරුවෙහි (සිංහල නිවේදනයේ පමණක්) අංක 34 සහ අංක 35 අයිතමයන් පිළිවෙලින් අංක 36 සහ අංක 37 වශයෙන් නැවත අංක ගත කිරීමෙන් ;

(ඉ) එහි I වැනි තීරුවෙහි (ඉංග්‍රීසි හා දෙමළ නිවේදනයේ පමණක්) අංක 37 සිට අංක 39 දක්වා අයිතමයන් පිළිවෙලින් අංක 35 සිට අංක 37 වශයෙන් නැවත අංක ගත කිරීමෙන් ;

(ඊ) එහි II වැනි තීරුවෙහි අංක 34 අයිතමයට පසු පහත සඳහන් අයිතමයන් ඇතුලත් කිරීමෙන් :

35. භූවිද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය.
36. සීමාසහිත GSMB තාක්ෂණික සේවා පුද්ගලික සමාගම.

(උ) එහි II වැනි තීරුවෙහි පහත අයිතමය ඉවත් කිරීමෙන් :-

14. සීමාසහිත කහගොල්ල ඉංජිනියරින් සර්විසස් සමාගම (කෙස්කෝ)

(ඌ) එහි III වැනි තීරුවෙහි "ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනත (1979 අංක 40)"අයිතමයට පසුව පහත අයිතමය එකතු කිරීමෙන් ;

- පතල් හා ඛනිජ පනත (1992 අංක 33)

(එ) එහි III වැනි තීරුවෙහි පහත අයිතමයන් ඉවත් කිරීමෙන් :-

- ප්‍රපාතන විරෝධී සහ ප්‍රතිතෝලන බදු පනත (2018 අංක 2)
- ආරක්ෂණ පියවර පනත (2018 අංක 3)

(19) එම නිවේදනයෙහි " අංක 22, ඩිජිටල් ආර්ථික අමාත්‍ය " ශීර්ෂය සම්බන්ධයෙන් පහත පරිදි:-

(අ) එහි I වැනි තීරුවෙහි අංක 8 අයිතමයට පසු පහත සඳහන් අයිතමයන් ඇතුලත් කිරීමෙන් :-

9. වර්ධනය වන තරඟකාරී වෙළඳපොළ තුළ, පොදු යහපත සුරකිමින් විදුලි සංදේශ කර්මාන්තයේ තිරසර සංවර්ධනය ප්‍රවර්ධනය කිරීම සඳහා විදුලි සංදේශ කටයුතු නියාමනය කිරීම.
10. නවීන තාක්ෂණය යොදා ගනිමින් සැමට තොරතුරු තාක්ෂණ පහසුකම් සැපයීම සඳහා අවශ්‍ය පියවර ගැනීම.
11. අන්තර් රාජ්‍ය ආයතන සඳහා තොරතුරු තාක්ෂණය හඳුන්වා දීම තුළින් රජයේ සේවා සැපයීමේ ඵලදායීතාව හා කාර්යක්ෂමතාව ඉහළ නැංවීම සඳහා තොරතුරු තාක්ෂණ මූලාරම්භය සඳහා පහසුකම් සැපයීම හා අධීක්ෂණය.
12. තොරතුරු තාක්ෂණ සාක්ෂරතාවය ප්‍රවර්ධනය සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
13. ග්‍රාමීය ප්‍රදේශ සඳහා සන්නිවේදන පහසුකම් පුළුල් කිරීම සඳහා මධ්‍යගත උපකාරක ජාලයක් ඇති කිරීම.
14. 5G සහ LTE+ වැනි සංඛ්‍යාත පරාසය තුළ ඉහළ කාර්යක්ෂමතාවයක් සහිත තාක්ෂණය සඳහා ප්‍රමුඛත්වය ලබා දීම.
15. පෞද්ගලික දත්ත ආරක්ෂණ විධිවිධාන හඳුන්වාදීම හා නියාමනය කිරීම.

(ආ) එහි I වැනි තීරුවෙහි අංක 9 සහ අංක 10 අයිතමයන් පිළිවෙලින් අංක 16 සහ අංක 17 වශයෙන් නැවත අංක ගත කිරීමෙන් ;

(ඇ) එහි II වැනි තීරුවෙහි අංක 7 අයිතමයට පසු පහත සඳහන් අයිතමයන් ඇතුලත් කිරීමෙන් ;

8. කලම්බු ලෝටස් ටවර් මැනේජ්මන්ට් කම්පැනි ප්‍රයිවට් ලිමිටඩ්
9. මාර්ගගත ක්‍රමවල සුරක්ෂිතභාවය පිළිබඳ කොමිෂන් සභාව

(ඈ) එහි III වැනි තීරුවෙහි "ශ්‍රී ලංකා විදුලි සංදේශ පනත (1991 අංක 25) සහ සංශෝධන" අයිතමයට පසුව පහත අයිතමය එකතු කිරීමෙන් ;

- මාර්ගගත ක්‍රමවල සුරක්ෂිත භාවය පිළිබඳ පනත (2024 අංක 9)

(20) එම නිවේදනයෙහි "අංක 23, වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍ය " ශීර්ෂය සම්බන්ධයෙන් පහත පරිදි:-

(අ) එහි II වැනි තීරුවෙහි පහත අයිතමය ඉවත් කිරීමෙන් ;

23. කුරුඳු සංවර්ධන දෙපාර්තමේන්තුව

(21) එම නිවේදනයෙහි "අංක 24, තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍ය" ශීර්ෂයේ I, II හා III වැනි තීරුවලට පසුව පහත සඳහන් නව ශීර්ෂය ඇතුළත් කිරීමෙන් :-

**25. නිවාස, ඉදිකිරීම් සහ ජලසම්පාදන අමාත්‍ය**

| *I වැනි තීරුව* | *II වැනි තීරුව* | *III වැනි තීරුව* |
|---|---|---|
| ***විෂයයන් හා කාර්යයන්*** | ***දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා*** | ***ක්‍රියාත්මක කළයුතු නීති සහ අණ පනත්*** |
| 1. රජය මගින් ක්‍රියාත්මක කරනු ලබන ජාතික ප්‍රතිපත්තීන් මත පිහිටා නිවාස, ඉදිකිරීම් සහ ජල සම්පාදන විෂයයන්ට සහ II වැනි තීරුවෙහි දැක්වෙන දෙපාර්තමේන්තු හා ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථාවන්හි විෂයයන්ට අදාළ ප්‍රතිපත්ති, උපායමාර්ග, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම.<br>2. අමාත්‍යාංශ විෂය පථයට අයත්වන මහජන සේවාවන් කාර්යක්ෂමව හා මහජන හිතකාමී අයුරින් ලබා දීම.<br>3. නාස්තිය හා දූෂණය පිටු දකිමින් අමාත්‍යාංශයේ කාර්යභාරය ඉටු කිරීම සහතික කිරීමට ඉවහල් වන ආකාරයට නවීන කළමනාකරණ ක්‍රම හා තාක්ෂණය යොදා ගනිමින් සියලුම ක්‍රම සහ විධි ප්‍රතිසංස්කරණය කිරීම.<br>4. පැල්පත් හා අඩු ආදායම්ලාභීන් සඳහා නිවාස සංකීර්ණ ඉදිකිරීම හා සංවර්ධනය.<br>5. නාගරික ප්‍රදේශවල දැරිය හැකි මිලකට නිවාස ව්‍යාපෘතීන් ලබා ගැනීම සඳහා විදේශයන්හි ජීවත් වන ශ්‍රී ලාංකිකයින් ආයෝජනයන් කිරීම ප්‍රවර්ධනය කිරීම.<br>6. රජයේ මැදිහත්වීමෙන් කොළඹ ප්‍රදේශයේ අඩු ආදායම්ලාභී ජනාවාසයන්හි පදිංචිකරුවන් හට දැරිය හැකි මිලකට නිවාස ලබා ගැනීමට පහසුකම් සැපයීම.<br>7. නාගරික හා අර්ධ - නාගරික ප්‍රදේශයන්හි අත්‍යාවශ්‍ය පහසුකම් සහිත විස්තීර්ණ නිවාස ව්‍යාපෘති සංවර්ධනය කිරීම.<br>8. නිවාස සංවර්ධන කටයුතු සඳහා ඉඩම් අයිතිය සම්බන්ධ ගැටළු වලට විසඳුම් ලබා දීමට අදාළ නීති සංශෝධනය කිරීම.<br>9. රජයේ නිල නිවාස සහ අනෙකුත් ගොඩනැගිලි සඳහා ප්‍රමිති හා ප්‍රතිමාන නියම කිරීම. | 1. ජාතික නිවාස සංවර්ධන අධිකාරිය<br>2. සීමාසහිත ගොඩනැගිලි ද්‍රව්‍ය සංස්ථාව<br>3. ගොඩනැගිලි දෙපාර්තමේන්තුව<br>4. රජයේ කර්මාන්ත ශාලා දෙපාර්තමේන්තුව<br>5. ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය<br>6. ඕෂන් ව්ව් ඩිවලොප්මන්ට් (ප්‍රයිවට්) ලිමිටඩ්<br>7. රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව<br>8. ජාතික යන්ත්‍රෝපකරණ ආයතනය<br>9. ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය<br>10. ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුව<br>11. ශ්‍රී ලංකා ඉංජිනේරුවරුන්ගේ සභාව<br>12. ඉදිකිරීම් ආරක්ෂණ අරමුදල | • ජාතික නිවාස සංවර්ධන අධිකාරිය පනත (1979 අංක 17)<br>• ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන පනත (2014 අංක 33)<br>• ජාතික ජලසම්පාදන සහ ජලාපවහන මණ්ඩල පනත (1974 අංක 2)<br>• ශ්‍රී ලංකා ඉංජිනේරුවරුන්ගේ සභාව පනත (2017අංක 4)<br>• වෙනත් අමාත්‍යවරයෙක් යටතට නිශ්චිතව පවරා නොමැති, මෙහි I හා II තීරුවල සඳහන් විෂයයන්ට අදාළ අනෙකුත් සියලු ව්‍යවස්ථාවන් |

| *I වැනි තීරුව* | *II වැනි තීරුව* | *III වැනි තීරුව* |
|---|---|---|
| ***විෂයයන් හා කාර්යයන්*** | ***දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා*** | ***ක්‍රියාත්මක කළයුතු නීති සහ අණ පනත්*** |
| 10. අඩු ආදායම්ලාභීන් සහ විශේෂිත ප්‍රජා කණ්ඩායම්ද ඇතුළුව මහජනතාවගේ නිවාස අවශ්‍යතාවය සපුරාලීම සඳහා නිවාස යෝජනා ක්‍රම සහ නිවාස මූලාධාර වැඩසටහන් ක්‍රියාත්මක කිරීම<br>11. පරිසර හිතකාමී ලෙස පිරිවැය ඵලදායී නිවාස තැනීමේ තාක්ෂණ ක්‍රම පිළිබඳ ග්‍රාමීය ජනතාවට මහපෙන්වීම<br>12. රජයේ ආයතනවලට යාන්ත්‍රික ඉංජිනේරු සේවා සැපයීම<br>13. අදාළ නීති රීති හා ප්‍රමිතීන්වලට අනුව ඉදිකිරීම් කර්මාන්ත ක්ෂේත්‍රයේ කටයුතු නියාමනය, ලියාපදිංචි කිරීම, විධිමත් කිරීම සහ ප්‍රමිතිකරණය<br>14. ඉදිකිරීම් කර්මාන්තයට උපදේශන හා නියාමන සේවා සැපයීම<br>15. බර ඉදිකිරීම් උපකරණ ක්‍රියාත්මක කරවීම හා නඩත්තු පිළිබඳ පුහුණුව<br>16. ගොඩනැගිලි ද්‍රව්‍ය කර්මාන්තය දියුණු කිරීම<br>17. දේශීය ඉදිකිරීම්කරුවන් ශක්තිමත් කිරීම<br>18. දේශීය සුළු හා මධ්‍ය පරිමාණ උප කොන්ත්‍රාත්කරුවන් ශක්තිමත් කිරීම හා ආරක්ෂාව සැලසීම<br>19. සුදුසු සහ තිරසාර තාක්ෂණය යොදා ගනිමින් දුෂ්කර ග්‍රාමීය ප්‍රදේශවල මූලික යටිතල පහසුකම් සංවර්ධනය කිරීම<br>20. ජාතික සංවර්ධන ඉලක්කයන් ළඟාකර ගත හැකි වන පරිදි ඉදිකිරීම් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා නවීන ඉංජිනේරු උපදේශන සේවාවන් ලබාදීම<br>21. සෑම පුරවැසියෙකුටම පිරිසිදු පානීය ජලය ලබාදීම තහවුරු කිරීම සඳහා අවශ්‍ය වන ක්‍රියාමාර්ග ගැනීම<br>22. ජලසම්පාදන සේවා, ජලාපවහන පද්ධති සහ සනීපාරක්ෂක පහසුකම් පිළිබඳව සොයාබලා ඒ පිළිබඳව නව සැලසුම් සකස්කර ක්‍රියාත්මක කිරීම හා නඩත්තුව<br>23. ග්‍රාමීය වැව් ජලාශ හා වාරිමාර්ග පද්ධතීන් සම්බන්ධීකරණය කරමින් ජල සුරක්ෂිතතාව සහ ජල යෝජනා ක්‍රම වැඩි දියුණු කිරීම<br>24. පානීය ජලය බෙදා හැරීමේදී සිදුවන ජලය අපතේ යාම වලක්වා ගැනීම | | |

| *I වැනි තීරුව* | *II වැනි තීරුව* | *III වැනි තීරුව* |
|---|---|---|
| *විෂයයන් හා කාර්යයන්* | *දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා* | *ක්‍රියාත්මක කළයුතු නීති සහ අණ පනත්* |
| 25. ප්‍රජා ජල සම්පාදන හා ව්‍යාපෘති කාර්යක්ෂමව හා විධිමත්ව ඉටු කිරීම සඳහා පියවර ගැනීම<br>26. ග්‍රාමීය ජනතාවට ප්‍රමිතියෙන් යුතු පානීය ජල සැපයීම සඳහා ප්‍රජා ජල සැපයුම් ව්‍යාපෘති නඩත්තු කිරීම හා දියුණු කිරීම<br>27. ජලාශ සංවර්ධනය හරහා ග්‍රාමීය පළාත්වල පානීය ජල සැපයුම ස්ථාවර කිරීම<br>28. II තීරුවෙහි දැක්වෙන ආයතනයන්ට පැවරී ඇති අනෙකුත් සියලුම විෂයයන්ට අදාළ කටයුතු<br>29. II තීරුවෙහි දැක්වෙන සියලුම ආයතනයන් අධීක්ෂණය කිරීම | | |

EOG 10 - 0189

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.